**ජාතික ඉතිරි කිරීමේ බැංකුව - 2018**
**------------------------------------------**

## 1.1 මතය
**----------**

ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ("බැංකුව") සහ එහි පරිපාලිතයේ ("සමූහය") 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

බැංකුවේ සහ සමූහයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම
**-----------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

බැංකුවේ සහ සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමූහය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍යය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හදුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයක් හදුනා නොගැනීම මගින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමූහයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ බැංකුවේ කාර්යයන් අඛන්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව

හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත් , වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව , බැංකුව ක්‍රියාකර ඇති බව ;
- බැංකුව සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව;
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව;.

## 1.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

### 1.5.1 ලැබීම්

----------

| විගණන ගැටළුව | කළමනාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) 2018 දෙසැම්බර් 31 දින වන විට වංචනික මුදල් ආපසු ගැනීම් වලින් බැංකුවට ලැබිය යුතු මුදල රු.මිලියන 110.5 ක් වන අතර පෙර වර්ෂය හා සැසදීමේදී එහි වැඩිවීම රු. මිලියන 15.7 ක් හෙවත් සියයට 16.6 ක් පෙන්නුම් කරයි. මෙම ලැබිය යුතු ශේෂය වැඩි වීමට ප්‍රධාන හේතුව 2018 දී ප්‍රධාන කාර්යාල ශාඛාවේ සිදු වූ වංචාවයි. ඉහත ශේෂයෙන් රු. මිලියන 85 ක් වසරකට වැඩි කාලයක් හිඟව පැවති අතර රු. මිලියන 29 ක් වසර පහකට වැඩි කාලයක් හිඟව පවතී. | ශේෂයන් ඉවත් කිරීමට පියවර ගනිමින් සිටින අතර, රුපියල් මිලියන 110.5 ක් වංචනික ලෙස ආපසු ලබා ගැනීමට එරෙහිව 2018 දෙසැම්බර් 31 දින වන විට රුපියල් මිලියන 86 ක ප්‍රමාණවත් ප්‍රතිපාදනයක් ද සිදුකර ඇත. | දිගු කාලීන හිඟ ශේෂයන් නැවත අය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) බැංකුව විසින් 2016 වර්ෂයේදී එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පීඑල්සී හි භාණ්ඩාගාර බැඳුම්කර වල මුදල් ආයෝජනය කර ඇති අතර ඊට අදාල ප්‍රාග්ධන අගය හා ලැබිය යුතු පොලී මුදල වන රු. මිලියන 153.6 ක මුදල 2019 ජුනි 30 දින වන විටත් ලැබී නොතිබුණි. | සටහන් කර ගන්නා ලදි. | ලැබිය යුතු ශේෂය අදාළ සමාගමෙන් අය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 1.5.2 අත්තිකාරම්

--------------

| විගණන ගැටළුව | කළමනාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (i) 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ ණය ශේෂය රු. මිලියන 329,131 ක් වූ අතර, ඉන් රු. මිලියන 5,212 ක් හෙවත් සියයට 1.6 ක් එම දිනට අක්‍රීය ණය ලෙස දැක්වුණු අතර එය 2017 වර්ෂයේ දී රු. මිලියන 299,304 ක් සහ රු. මිලියන 4,987 ක් වේ. තවද, 2018 දෙසැම්බර් 31 දිනට අක්‍රීය ණය ශේෂයන් අතරින් රු.මිලියන 143 ක් හෙවත් සියයට 2.7 ක් වසර 3 කට වැඩි කාලයක් හිඟව පැවතුණි. | සටහන් කර ගන්නා ලදි. | අක්‍රීය ණය ශේෂය අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) 2018 සැප්තැම්බර් 17 දින කල් පිරුණු එක්සත් ජනපදඩොලර් මිලියන 750 ක බැඳුම්කරය බැංකුව විසින් ආපසු ගෙවා තිබුණි. ජෙනරාල් සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයට (KDU) නිකුත් කරන ලද එක්සත් ජනපද.ඩොලර්. ණය මුදල 2018 සැප්තැම්බර් 17 දිනට කල් පිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත් එම ආයතනය කල්පිරීමේදි ණය මුදල ගෙවීමට නොහැකිවීම හේතුවෙන් බැඳුම්කරය ආපසු ගෙවීමට වසර 3 ක කාලයක් සඳහා විචල්‍ය පොලී අනුපාතය සියයට දෙකක් එකතු කොට ජර්මනියේ කොමර්ස්බැන්ක් වෙතින් තවත් එක්සත් ජනපද ඩොලර් මිලියන 100 ක ණයක් ලබා ගැනීමට බැංකුවට සිදු වී තිබුණි. | සටහන් කර ගන්නා ලදි. | බැංකුවේ සුමට මෙහෙයුම් කටයුතුවල අවශ්‍යතාවය උදෙසා අදාල ගණුදෙනුකරුවන්ගෙන් සියළු හිඟ මුදල් අයකරගත් බව සහතික කරගත යුතුය. |
| (iii) ආරක්ෂක අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද 2019 මාර්තු 25 වන දින කැබිනට් සංදේශයට අනුව, නැවත සංශෝධනය කරන ලද ණය මුදල ආවරනය කරමින් ජෙනරාල් සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයට (KDU) ට ලබා දී ඇති ණය මුදල සම්බන්ධයෙන් නිකුත් කර ඇති දැනට පවතින භාණ්ඩාගාර ඇපකරයේ කාලසීමාව දීර්ඝ කිරීමට අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වෙතත්, මේ දක්වා භාණ්ඩාගාර ඇපකරය ලබාගෙන නොමැත. ණය මුදල සංශෝධනය කිරීමෙන් පසු පාරිභෝගිකයාට නියමිත වේලාවට ණය මුදල ගෙවීමට නොහැකි වීම හේතුවෙන් ලංකා රුපියල් සහ එක්සත් ජනපද.ඩොලර් ණය සඳහා පාරිභෝගිකයා වෙත පනවන ලද දඩ මුදල පිළිවෙලින් රු. මිලියන 56 ක් සහ එක්සත් ජනපද.ඩොලර් 19,364 ක් වේ. කෙසේ වෙතත් එය මේ දක්වා ගෙවා නොතිබුණි. | සටහන් කර ගන්නා ලදි. | අදාල ගණුදෙනුකරුවන්ගෙන් මුළු හිඟ මුදල් නියමිත වේලාවට අයකරගත් බව සහතික කරගත යුතු අතර ඉතිරි භාණ්ඩාගාර ඇප මුදල් හා කාලය වැඩිකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iv) | 2018 දෙසැම්බර් 31දින වන විට බැංකුව විසින් ලබා දී ඇති මුළු උකස් අත්තිකාරම් මුදල රු. මිලියන 28, 010.16 ක් වන අතර එහි වෙළඳපල වටිනාකම රු. මිලියන 49, 808.78 ක් වේ. මුළු උකස් අත්තිකාරම් අතුරින් 2018 දෙසැම්බර් 31 දිනට අක්‍රිය උකස් අත්තිකාරම් රු. මිලියන 233.72 ක් නියෝජනය කරනු ලබයි. අක්‍රිය උකස් අත්තිකාරම් පිළිබඳ වයස් විශ්ලේෂණය අනුව වර්ෂ 1 සිට 3 දක්වා කාලයක් සඳහා රු .මිලියන 211.46 ක ප්‍රමාණයක් හිඟව පැවති අතර රු. මිලියන 22.25 ක් වසර 3 කට වැඩි කාලයක් හිඟව පවති. | 2018 දෙසැම්බර් 31 දිනට උකස් අත්තිකාරම් මත අක්‍රියණය අනුපාතය සියයට 0.83 සිට 0.78දක්වා අඩු වී තිබුණි. නීතිමය නඩු සහ විසඳීමට තිබෙන විමර්ශන කටයුතු හේතුවෙන් සමහර උකස් අත්තිකාරම් වසර තුනකට වැඩි කාලයක සිට හිඟව පැවතුනි. | බැංකුවේ අක්‍රිය උකස් අත්තිකාරම් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (v) | සැපයුම්කරුවන්ට ගෙවන ලද අත්තිකාරම් එකතුව රු. මිලියන 8.15 ක් වසරකට වැඩි කාලයක් තුල හිඟව පැවති අතර ඉන් රු.මිලියන 4.08 ක් 2019 සැප්තැම්බර් වන විට අයකරගෙන තිබූ අතර ශේෂය විගණන දිනය වන විටත් පියවා නොතිබුණි. | 2019 සැප්තැම්බර් 25 දින වන විට රු. මිලියන 4.08 ක මුදලක් අය කර ගෙන තිබූ අතර, 2018 දෙසැම්බර් 31 දින වන විට ඉතිරිව ඇති රුපියල් මිලියන 4.07 ක් නිරවුල් කිරීමට පියවර ගෙන තිබුණි. | අදාල සැපයුම්කරුවන්ගෙන් මුළු හිඟ මුදල් අයකරගත් බව සහතික කරගත යුතුය. |
| (vi) | යම් ගනුදෙනුකරුවකුට 2012 මැයි 11 දින බැංකුව විසින් රු .900,000 ක පුද්ගලික ණය මුදලක් ලබා දී තිබුණි. මෙම ණය මුදලේ මුල් ලියකියවිලි ඇතුලත් ලිපි ගොනුව අස්ථානගත වී තිබුණි. වාරික දෙකක් පමණක් අයකර ගෙන තිබූ අතර ණය ලිපිගොනු භාර නිලධාරියාට එරෙහිව කිසිදු පරීක්ෂණයක් සිදු කර නොමැත. බැංකුවේ ණය අයකර ගැනීමේ ප්‍රතිපත්තින්හි 8 සහ 9 වගන්තිවලට අනුව ඇපකරුවන්ගෙන් හෝ ණය ආපසු අයකර ගැනීම සඳහා හෝ කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | සටහන් කර ගන්නා ලදි. | වරදකරුවන්ට එරෙහිව අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සහ ආරක්ෂිත ලිපිලේඛනවල ආරක්ෂාව සහතික කිරීමට අභ්‍යන්තර පාලනය වඩා ශක්තිමත් කල යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත** (i) 47 වන වගන්තිය | වර්ෂ 10 කට වඩා කාලයක් අක්‍රියව පවත්නා තැන්පතු හිමිකම් නොපෑ ගිණුමට මාරු කළ යුතුය. කෙසේ වුවද , එම සංචිත ගිණුමට මාරුකිරීමෙන් තොරව රු. මිලියන 676.24 ක මුදලක් 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල අක්‍රිය ලෙස පැවතුණි. | 2018 වර්ෂයේදී අක්‍රිය ගිණුමේ බැරට පවතින /හිමිකම් නොපෑ තැන්පතු ගිණුමට රුපියල් මිලියන 2,001 ක් මාරු කර තිබුණි. ගනුදෙනුකරුවන්ට පසුව සිදුකරන ලද ගෙවීම් ඉහළ ප්‍රතිශතයක් ගැනිම හේතුවෙන් කලින් කල මාරු කිරීම්සිදු කෙරේ.ඉතිරි ශේෂය ඊළඟ වසරේ මාරුවීම් සඳහා සලකා බලනු ලැබේ. | උක්ත නියෝගයට දක්වන දැඩි අනුකූලතාවය සහතික කල යුතුය. |
| (ii) 47 (4) වන වගන්තිය | හිමිකම් නොපෑ තැන්පතු සංචිතයට මාරු කල මුදලින් ගණුදෙණුකරුවන්ට ගෙවු මුදල්, භාණ්ඩාගාර ලේකම් විසින් ඒකාබද්ධ අරමුදලින් බැංකුවට හැකි තරම් ඉක්මනින් ගෙවිය යුතුය. බැංකුව විසින් 2000 - 2018 දක්වා කාලය ඇතුලත රු. මිලියන 474.18 ක් එලෙස ගෙවා තිබුණි. එම මුදල අතුරින් 2019 වර්ෂය තුලදී රු.මිලියන 300 ක් භාණ්ඩාගාර ලේකම් විසින් ප්‍රතිපූර්ණය කර තිබුණද ශේෂය විගණන දිනය වන විටත් එය පියවා නොතිබුණි | මේ වන විටත් භාණ්ඩාගාරයට ඉල්ලීම් කර ඇති අතර මෙය අනුගමනය කෙරෙමින් පවතී.2019 වර්ෂය තුළ අක්‍රිය ශේෂ ප්‍රතිපූරණය කිරීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් රු.මිලියන 300 ක මුදලක් ලැබී තිබුණි. | හිඟ මුදල භාණ්ඩාගාරයෙන් අයකරගැනිමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 4,500 ක ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු. මිලියන 9,716 ක් විය. එබැවින් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 5,216 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ශුද්ධ පොලී ආදායම අඩුවීම, වෙළඳාමෙන් වන ශුද්ධ ලාභය, වෙනත් ශුද්ධ මෙහෙයුම් ආදායම සහ හානිකරන වියදයෙහි වැඩිවීම සහ පුද්ගලික වියදම් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලය පිරිහීමට බලපෑ ප්‍රධාන හේතු විය.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමයන්හි උපනති විශ්ලේෂණය

බැංකුවේ ශුද්ධ පොලී ආදායම ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී රු.මිලියන 249 කින් හෙවත් සියයට 1 කින් අඩු වී තිබුණි. 2018 මාස නවයක කාලයට අදාළ කල්පිත බද්ද නොසැලකීම සහ ස්ථාවර තැන්පතු පොලී අනුපාත ඉහළ යාම, තැන්පතු පිරිවැය ඉහළ යාමට බලපෑ ප්‍රධාන හේතු විය. බැංකුවේ රජයේ සුරැකුම් කළඹේ සහ හිමිකම් වල සාධාරණ අගය අඩුවෙමින් පැවතීම හේතුවෙන් වෙළඳාමෙන් වූ ශුද්ධ ලාභය රු. මිලියන 1,913 කින් හෙවත් සියයට 159 කින් අඩු වීමට හේතු විය. 2018 වර්ෂය සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගම (NSBFMC) විසින් ලාභාංශ ප්‍රකාශයට පත් නොකිරීම හේතුවෙන් ශුද්ධ මෙහෙයුම් ආදායම පෙර වසරට සාපේක්ෂව රු. මිලියන 630 කින් හෙවත් සියයට 37 කින් අඩු වී තිබුණි. හානි කරන වියදම් ප්‍රවේශයේ සිට අපේක්ෂිත ණය අලාභ ප්‍රවේශය දක්වා පරිවර්තනය කිරීම හේතුවෙන් ණය සඳහා හානි කරන අලාභ සහ අනෙකුත් අලාභ ර. මිලියන 105 හෙවත් සියයට 14 කින් වැඩි වී තිබුණි. සාමූහික ගිවිසුමට අනුව 2018 ජනවාරි 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි සේවකයින්ට ලබා දී ඇති වැටුප් වැඩිවීම් සහ 2018 වර්ෂයේ VI සහ VII ශ්‍රේණිවල ඇතැම් කොන්ත්‍රාත් පදනම් සේවකයින් ස්ථිර සේවක මණ්ඩලයට අන්තර්ග්‍රහණය කිරීම හේතුවෙන් බැංකුවේ පුද්ගලික වියදම් රු. මිලියන 2,376 කින් හෙවත් සියයට 35 කින් ඉහළ ගොස් තිබුණි.

## 2.3 අනුපාතවිශ්ලේෂණය

(i) පෙර වර්ෂය හා සැසඳීමේ දී 2018 වර්ෂය තුල අඩු ලාභදායිකත්වයට ප්‍රධාන හේතුව, සාමාන්‍ය කොටස්කරුවන්ගේ අරමුදල මත ප්‍රතිලාභය (ROE) සහ බැංකුවේ සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභය පිළිවෙලින් සියයට 16.87 කින් සහ සියයට 0.69 කින් අඩුවීමයි.

(ii) පෙර වර්ෂය හා සැසඳීමේ දී ද්‍රවශීලතා වත්කම් අනුපාතය 2018 දී සියයට 18.5 කින් අඩු වී තිබුණි. එහෙත් එම අනුපාතය කර්මාන්තයේ සාමාන්‍ය සියයට 47.7 ට වඩා ඉහළ අගයක් ගෙන තිබුණි.

(iii) 2018 දෙසැම්බර් 31දිනට බැංකුවේ මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය සියයට 16.14 ක් ලෙස වාර්තා වූ අතර එය සියයට 12.875 වන අවම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයට වඩා මදක් ඉහළ අගයක් ගෙන තිබුණි.

(iv) පෙර වර්ෂය හා සැසඳීමේ දී 2018 වර්ෂය සඳහා බැංකුවේ ශුද්ධ පොලී ආන්තිකය සියයට 0.19 කින් අඩු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 ආර්ථික නොවන ගනුදෙනු

| විගණන ගැටළුව | කළමනාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉදිකිරීම් කටයුතු නතරකර ඇති බැංකුවේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ මහල් 18 කින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2008 සිට රු. මිලියන 35.23 ක් වැය කර තිබුණි. එබැවින් ඒ සඳහා දරන ලද වියදම ඵල රහිත වියදමක් ලෙස දැක්විය හැක. . | මහල් 18 කින් යුත් ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය, මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය ඇතුලත්ව බාහිර වෘත්තීය ආයතනයන් සමග ආරම්භ කල අතර එහි ප්‍රාග්ධන වියදමඔවුන්ගේ වෘත්තීය සේවය සඳහා ලබාදුන් ගෙවීම නියෝජනය කරයි. | අවශ්‍ය අනුමැතීන් ලබාගැනීමෙන් පසුව ශේෂය ලියාහැරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

තවද, නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රධාන කාර්යාලයීය ගොඩනැගිල්ලට යාබදව පිහිට ඔවුන්ට අයත් බිම් කොටසක් 50 අවුරුදු බදු පදනම මත පවරාදීමට එකග වී ඇත.

මෙම බිම් කොටස නාගරික සංවර්ධනඅධිකාරියෙන් ලබාගැනීමට ඇති හැකියාව පිළිබඳ සොයා බලා සාකච්ඡා කිහිපයක් පවත්වා ඇති අතර ඒ අනුව ප්‍රධාන කාර්යාලීය බිමෙහි ප්‍රධාන සංවර්ධන කටයුතු පසුව සැලසුම් කරනු ලැබේ.

## 3.2 හඳුනාගත් පාඩු

------------------

| විගණන ගැටළුව | කළමනාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 නොවැම්බර් සිට 2018 අගෝස්තු දක්වා කාලය තුල ව්‍යාජ හැඳුනුම්පත් භාවිතා කරමින් ප්‍රධාන කාර්යාලීය ශාඛාවේ සේවය කළ සේවකයෙකු විසින් වංචනික ලෙස නිර්මාණය කර වියපැහැදම් කරන ලද ණය 16 ක් ඉතිරි කිරීමේ ගිණුම් 16 කට බැර කර තිබුණි. මෙම වංචා හේතුවෙන් බැංකුවට සිදුවූ මූල්‍ය අලාභ රු. මිලියන 25.6 විය. වැරදිකරු බැංකු සේවයෙන් සේවය අත්හිටුවා රිමාන්ඩ් ගත කර තිබුණි. විත්තිකරුට එරෙහිව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 11288/18 යටතේ නඩුවක් විභාගය වෙමින් පවතී. නොසැලකිලිමත් ලෙස ක්‍රියා කිරීම හේතුවෙන් තවත් නිලධාරීන් පස් දෙනෙකු ඉහත වංචාවට වගකිව යුතු අය ලෙස හඳුනාගෙන ඇති අතර 2019 ජනවාරි 30 දිනැති විමර්ශන වාර්තාව මගින් ඔවුන්ට එරෙහිව අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ කරන ලදී. ප්‍රධාන කාර්යාලීය ශාඛාවේ අස්ථානගත වී ඇති ණය ලිපිගොනු 32 අතුරින් ලිපිගොනු 16 ක් ව්‍යාජ ලිපිගොනු ලෙස අනාවරණය විය. | අලාභ සම්බන්ධයෙන් ඔබේ අදහස් දැක්වීම් සටහන් කරගන්නා ලදී. ප්‍රධාන කාර්යාලීය ශාඛාවේ අස්ථානගත වී ඇති ණය ලිපිගොනු 32 අතුරින් ලිපිගොනු 16 ක් පමණක් ව්‍යාජ ලිපිගොනු වේ.<br><br>අදාල කටයුතු ඉටු කිරීමෙන් පසු පද්ධතියෙන් ඉවත්විය යුතු බව ශාඛාවන්ට දැනටමත් උපදෙස් නිකුත්කර ඇත. තවද, අනවසර ඇතුල්වීම් වලින් ආරක්ෂා වීමට පද්ධතිය ඉහල මට්ටමක පවත්වා ගැනීමට කටයුතු කර ඇත. | ඉදිරියේදී මෙවැනි ආකාරයේ වංචනික ක්‍රියා සිදුවීම වලක්වාගැනීම ට බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතාව

| විගණන ගැටළුව | කළමනාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (i) 1971 අංක 30 දරණ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ 2 (අ) වගන්තියහා ඊට අදාල සංශෝධන අනුව බැංකුවේ අරමුණ විශේෂයෙන් සීමිත අර්ථයෙන් ගත් කල ශ්‍රී ලංකාවේ ජනතාව අතර ඉතුරුම් ප්‍රවර්ධනය කිරීම සහ ලාභදායී ඉතුරුම් ආයෝජන එක්රැස් කිරීමයි. 2010 සිට 2018 දක්වා කාලය තුළ බැංකුවේ තැන්පතු (ඉතුරුම්) පදනම බැංකු අංශය සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු අංශය සමඟ සංසන්දනය කිරීමෙන් පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.<br><br>▪ 2010 සිට 2018 දක්වා බැංකු අංශයේ සමස්ත තැන්පතු පදනම සියයට 228 කින් වර්ධනය වී ඇතත්, එම කාලය තුළ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තැන්පතු පදනම් වර්ධනය සියයට 136 ක් පමණක් විය . එම නිසා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ වෙළඳපොළ කොටස 2010 දී සියයට 13.7 සිට 2018 දී සියයට 9.9 දක්වා පිරිහී තිබුණි.<br>▪ බලපත්‍රලාභී විශේෂිත බැංකු අංශයට සාපේක්ෂව ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ වෙළඳපල කොටස ද 2010 දී සියයට 82.1 සිට 2018 දී සියයට 77.4 දක්වා පිරිහී තිබුණි.<br>▪ සලකා බලන කාලය තුල බැංකුවේ තැන්පතු පදනමේ වර්ෂයෙන් වර්ෂයට වර්ධනයබැංකු අංශයේ වර්ෂයෙන් වර්ෂයට වර්ධනයට වඩා අඩු මට්ටමක පැවති අතර එය පනතෙහි අරමුණ අඩුවෙන් සාධනය කර ගැනීමකි.<br><br>▪ 2010/2011 වර්ෂය හැරුණු විට බැංකුව සිය ආයතනික සැලැස්මේ දක්වා ඇති වාර්ෂික වර්ධන ඉලක්කය සපුරා ගෙන නොතිබුණි. | සටහන් කරගන්නා ලදී. | වෙළඳපල වර්ධන අනුපාතය සමග එකඟවන ලෙස බැංකුවේ තැන්පතු පදනම මත වර්ධන අනුපාතය පවත්වාගැනීමට අවශ්‍ය සියළු ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ii) 2018 දෙසැම්බර් 31 දිනට බැංකුවේ කොටස් වෙළඳ කළඹ, කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත සමාගම් 41 කින් සමන්විත වන අතර, රු.මිලියන 3,273 ක් වන එහි සාධාරණ වටිනාකම රු. මිලියන 1,552 ක සලකුණු කරන ලද වෙළඳපල අලාභයක් පෙන්නුම් කරයි. සමාගම් නමයක් වෙත ආයෝජනය කරන ලද රු. මිලියන 1,169 ක් සම්බන්ධයෙන් මිලදී ගත් වර්ෂයෙන් පසු කිසිදු ගනුදෙනුවක් සිදුකර නොතිබුණි. | සටහන් කරගන්නා ලදී. | බැංකුවට ලාභදායිත්වයක් උපදවීමට හිමිකම් ආයෝජන කළඹක් පවත්වා ගැනීමටඅවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය. |

## 3.4 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත දේපල පිරියත හා උපකරණ

| විගණන ගැටළුව | කළමනාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පර්චස් 38.8 ක ඉඩමක් 2008 වර්ෂයේදී නාගරික සංවර්ධන අධිකාරියෙන් වසර 50 ක කාලයක් සඳහා බදු පදනම මත ලබා ගෙන තිබුණ ද මෙම ඉඩම පසුගිය වසර 10 තුළ නිසි ලෙස භාවිතා කර නොතිබුණි. | දිගුකල් බදු පදනම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් හඳුනාගත්පර්චස් 106 ක යාබද ඉඩමෙන් පර්චස් 38.8 ක් විශාලැති බද්දට ගත් ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය විසින් පවුල් නිරවුල් කිරීමට හඳුනාගෙන තිබූ බැවින් ස්ථිර සංවර්ධන කටයුතු සඳහා භාවිතා කර නොතිබුණි.<br>කෙසේ වෙතත් මෙම ඉඩමේ මහල් ගණනාවකින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට කටයුතු සූදානම් කර ඇත. | ඉඩම බැංකුවේ ඵලදායී කාර්යයක් සඳහා භාවිතා කළ යුතුය. |

## 3.5 වෙනත් සංවිධානවලට මුදාහරින ලද සම්පත්

| විගණන ගැටළුව | කළමනාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| PED 12 හි 9.4 ඡේදයට අනුව, ව්‍යාපාරයක සේවකයෙකු කැබිනට් මණ්ඩලයේ අනුමැතියකින් තොරව අමාත්‍යාංශයකට හෝ වෙනත් ආයතනයකට නිදහස් නොකළ යුතු අතර, එම කාලය තුළ නිදහස් කරන ලද සේවකයාට කිසිදු දීමනාවක් නොගෙවිය යුතුය. කෙසේ වෙතත්, 2018 වර්ෂය තුළ, ඉහත චක්‍රලේඛය මගින් ලබා දී ඇති උපදෙස් වලට පටහැනිව සේවකයින් අට දෙනෙකු අමාත්‍යාංශ හතරකට නිදහස් කර තිබුණි. එම විශේෂිත සේවකයන් නිදහස් කිරීමට සම්බන්ධයෙන් වන නිශ්චිත ලිපි ලේඛණ ඔවුන්ගේ පුද්ගලික ලිපිගොනු වල ඇතුළත් කර නොතිබුණි. නිදහස් කරන ලද සේවකයින්ගේ වේතනය, අතිකාල, ප්‍රසාද, වෛද්‍ය සහ නිවාඩු මුදල් කිරීම් සඳහා බැංකුව විසින් දරන ලද මුළු වියදම රු. මිලියන 6.12 ක් විය. කෙසේ වෙතත් මෙම මුදල අදාළ අමාත්‍යාංශයෙන් ප්‍රතිපූරණය කර නොතිබුණි. | අමාත්‍යාංශ වෙත මුදාහැර තිබූ සේවකයින් අට දෙනෙකු නැවත බැංකු සේවාව සඳහා කැඳවා තිබුණි. ඒ අනුව ඔවුන්2018 දෙසැම්බර්, නොවම්බර් සහ ඔක්තෝබර් මාසවලදී බැංකුවේ රාජකාරි භාරගෙන තිබුණි. බැංකුව විසින් දැනට කිසිදු සේවකයෙකු අමාත්‍යාංශවලට මුදාහැර නොමැත. | වෙනත් ආයතන වෙත සම්පත් මුදාහැරීමේදී උක්ත නියෝග කෙරෙහි දැඩි අවධානය දැක්විය යුතුය. |

## 3.6 මානව සම්පත් කළමණාකරණය

| විගණන ගැටළුව | කළමනාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) 2018 දෙසැම්බර් 31 දිනට බැංකුවේ අනුමත කාර්යා මණ්ඩලය සේවකයන් 4,978ක් විය. මේ සම්බන්ධයෙන් පහත නිරික්ෂණයන් කරනු ලැබේ.<br><br>▪ 2018 දෙසැම්බර් 31 දිනට බැංකුවේ අනුමත කාර්ය මණ්ඩලය 4,512 ක් වූ අතර එය 4,262 ක ස්ථිර කාර්ය මණ්ඩලයෙන් හා කොන්ත්‍රාත් පදනම මත 250 කින් සමන්විත විය.ඒ අනුව එම දිනට තනතුරු 466ක් පුරප්පාඩුව පැවතුණි.<br><br>▪ 2018 දෙසැම්බර් 31 දිනට විධායක ශ්‍රේණියේ කාර්යය මණ්ඩලය 870 ක් වුවද සත්‍ය කාර්යය මණ්ඩලය 570 ක් වූ අතර එය ස්ථිර කාර්යය මණ්ඩලය 565 කින් හා කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 05 දෙනෙකුගෙන් සමන්විත වී තිබුණි.<br><br>▪ 2018 වර්ෂය අවසාන වන විට විධායක ශ්‍රේණියේ තනතුරු 300 හෙවත් සියයට 34 ක් අනුමත කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු පැවතුණි. ඉහත පුරප්පාඩු තනතුරු වලට සහකාර සාමාන්‍යාධිකාරවරු 06 ක්, ප්‍රධාන කළමණාකරුවන් 26 ක්, ජ්‍යෙෂ්ඨ කළමණාකරුවන් 07 ක්, කළමණාකරුවන් 12 ක් , සහකාර කළමණාකරුවන් 235 ක් හා රහස්‍ය ලේකම්වරු 08 ක් ඇතුලත් වේ.මෙය බැංකුවේ සුමට ක්‍රියාකාරිත්වය සඳහා අහිත කර ලෙස බලපා තිබුණි. කෙසේ වෙතත් විධායක අංශයේ පුරප්පාඩු වූ තනතුරු පිරවීමට 2019 වර්ෂය තුල උසස්වීම් 236 ක් ලබා දී තිබුණි. | විධායක වර්ගයේ පුරප්පාඩු තනතුරු පිරවීමට 2019 වර්ෂය තුලදී උසස්වීම් 236 ක් ප්‍රදානය කර තිබූ අතර එයට බැංකු සහ බැංකු නොවන අංශයේ සහකාර සාමාන්‍යාධිකාරි 7 ක්, ප්‍රධාන කළමනාකරුවන් 21 ක්, ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් 42 ක්, කළමනාකරුවන් 61 ක් සහ සහකාර කළමනාකරුවන් 156 ක් ඇතුලත් වේ. | බැංකුවේ සුමට මෙහෙයුම් කටයුතුවල අවශ්‍යතාවය උදෙසා පුරප්පාඩුව ඇති තනතුරු පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) මාණ්ඩලික සහකාර (ශ්‍රේණිය VI) හා කාර්යාල කාර්ය සහයක (ශ්‍රේණිය VII) යන තනතුරු සඳහා බඳවා ගැනීම පිළිබඳව පහත නිරික්ෂණයන් කරනු ලැබේ.<br><br>▪ බැංකුවේ අනුමත මුළු සේවක සංඛ්‍යාව5,406 ක් අතුරින් මාණ්ඩලික සහකාර සහ කාර්යාල කාර්ය සහකාර තනතුරු සඳහා අනුමත කාර්ය මණ්ඩලය පිළිවෙලින් 2,066 සහ 563 ක් විය. ඒ අනුව මුළු කාර්ය මණ්ඩලයෙන් සියයට 48.6 ක් (%) එම තනතුරු සඳහා වෙන්කර තිබුණි. ඉහත තනතුරු සඳහා බඳවා ගැනීම සිදු කර තිබුණේ සුදුසුකම් ලත් අපේක්ෂකයින්ගෙන් ප්‍රසිද්ධියේ අයදුම්පත් කැඳවීමකින් තොරව අමාත්‍යාංශය සහ කළමනාකාරිත්වය විසින් ඉදිරිපත් කරනු ලබන ලැයිස්තු භාවිතා කිරීමෙනි. එබැවින් ශ්‍රී ලංකාවේ | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව 2018 සහ 2019 වර්ෂයන්හිදී අනුමත කාර්ය මණ්ඩලයේ පැවති තනතුරු පිරවීමට පුහුණුවන්නන් සහ කාර්යාල සහායකයින් බඳවාගෙන තිබුණි. කෙසේ වෙතත් , ඉදිරියේදී මෙවැනි බඳවාගැනීම් වලට විනිවිදභාවයකින් යුත් ක්‍රමයක් යොදාගැනීමට තීරණය කර තිබුණි. | VI සහ VII ශ්‍රේණිවලට බඳවාගැනීමේදී ඒකාකාරී සහ විනිවිදභාවයකින් යුත් ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රැකියා වෙළඳපොලේ රැකියා අපේක්‍ෂා කරන සමස්ත ජනතාවටම එය අසාධාරණයක් වන බව නිරීක්ෂණය විය<br><br>▪ 2018/2019 කාල සීමාව තුළ අපේක්ෂකයින් 39 දෙනෙකු පුහුණුවන්නන් ලෙස බඳවාගෙන තිබුණේ මාස 6 ක පුහුණු කාලයකින් සහ වසර 1 ක කොන්ත්‍රාත් කාලයකින් පසුව මාණ්ඩලික සහකාර තනතුරට ඇතුළත් කර ගැනීමේ අපේක්‍ෂාවෙනි. එම කාලය තුළම කාර්යාල සහකාර තනතුරට අන්තර්ග්‍රහණය කිරීමේ අපේක්‍ෂාවෙන් අපේක්ෂකයින් 37 දෙනෙකු කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන තිබුණි. එම බඳවා ගැනීම් සම්පූර්ණයෙන්ම පදනම් වී ඇත්තේ අමාත්‍යාංශය සහ කළමනාකරණය විසින් සපයනු ලබන ලැයිස්තු මත පදනම්ව වන අතර බඳවා ගැනීමේ ක්‍රියාවලියේ කිසිදු විනිවිදභාවයක් නිරීක්ෂණය නොවිණි.<br>2019 ජුලි 31 දිනට, මාණ්ඩලික සහකාර සහ කාර්යාල සහකාර තනතුරු වලට අන්තර්ග්‍රහණය කිරීම සඳහා බලාපොරොත්තු වූ මුළු සේවකයින් සංඛ්‍යාව පිළිවෙලින් 146 සහ 62 විය. | | |
| (iii) | සේවකයින් පස් දෙනෙකු ඔවුන්ගේ බඳවා ගැනීම් සඳහා අවශ්‍ය අවම සුදුසුකම් සපුරා නොමැති බව නිරීක්ෂණය විය | සටහන් කරගන්නා ලදී. | බැංකුවේ බඳවාගැනීමේ ක්‍රමවේදය අනුව බඳවාගත් සියළු පුද්ගලයන් අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇති බව සහතික කරගත යුතුය. |